# පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක් - හම්බන්තොට අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින්

*එච්. ටී. වී. එම්. ආරියරත්න*[1]

දෙමව්පියන් විසින් මෙලොවට දයාද කරන දරුවා දාර්ශනිකයෙකු, උගතෙකු, බුද්ධිමතෙකු මෙන් ම සමාජයට වටිනා සම්පතක් බවට පත් කරන්නේ පාසල තුළින් වන අතර එහි දී ගුරුවරයාගේ දායකත්වය අතිශය වැදගත් වේ. එවැනි සුවිශේෂ කර්තව්‍යයක් සිදු කරන ගුරුවරයා ගුරුවරයෙකු ලෙස තෘප්තිමත් ව තම රැකියාවේ නිරත වන්නේ ද යන්න මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ගුරුවරයා යනු පාසල් පද්ධතියේ පවතින මානව ප්‍රාග්ධනය වන බැවින් ඔවුන් කළමනාකරණ කිරීම බෙහෙවින් වැදගත් ය. ගුරුතෘප්තිය කෙරහි බලපාන සාධක සොයා බැලීම මෙම අධ්‍යයනයේ පසුබිම වේ. මේ ඔස්සේ ග්‍රාමීය පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ සේවාව සඳහා දරන ආකල්පය තුළ රැකියා තෘප්තිය, අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර තෘප්තියට බලපාන සාධක, ගුරුවරයා මුහුණපාන සමාජ - ආර්ථික ගැටලු හා ගුරු තෘප්තිය වර්ධනය කිරීමේ මාර්ග සොයා බැලීමක් මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කෙරෙයි. මෙම අධ්‍යනයට මිශ්‍ර පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදී. ඒ අනුව දකුණු පළාතට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධ්‍යාපන කොට්ඨාසයට අයත් ගුරවරුන් හා විදුහල්පතිවරුන් ඇතුලු 60 දෙනෙකුගේ නියැදියක් භාවිත කරන ලදී. දත්ත එක්රැස් කිරීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලී ක්‍රමය (Google form) යොදා ගෙන දත්ත විශ්ලේෂණයට බහුගුණ ප්‍රතිපායන අකෘතිය මෙන් ම ගුරු තෘප්තිය පරායත්ත විචල්‍ය ලෙස යොදා ගනිමින් වැටුප, පාසල්වල පවතින යටිතල පහසුකම්, විදුහල්පතිගේ කළමනාකාරීත්වය, සහෝදර ගුරුභවතුන් අතර බවතින සබඳතාව, සමාජ පිළිගැනීම, පන්ති කාමරයේ පවතින පහසුකම් හා උගන්වනු ලබන විෂය යනාදිය ස්වායත්ත විචල්‍යන් ලෙස යොදගනිමින් දත්ත විශ්ලේෂණය කර ඇති සහසම්බන්ධතා අකෘතියට අනුව නිර්ණන සංගුණකය 0.589ක් වේ. ඒ අනුව ස්වායත්ත විචල්‍යය හා පරායත්ත විචල්‍යය අතර ධන සම්බන්ධතාවක් ඇත. වර්තමාන පවතින තත්ත්වයන් යටතේ ගුරුවරයෙකු ලෙස මෙම වෘතීයේ ම නිරත වීමට 87%ක් කැමැත්ත පළ කර ඇත. ඉතුරු 13% ම වෙනත් රැකියාවක් ලැබුණ හොත් යෑමට කැමත්තක් දක්වති. මෙම 13% තුළ සිටින ගුරුවරුන් බොහෝ දෙනෙක් තරුණ වයසේ පසුවෙති. තෘප්තිමත් ගුරුවරුන් 71.7%ක් ද, තරමක් තෘප්තිමත් ගුරුවරුන් 25%ක්ද, තරමක් අතෘප්තිමත් ගුරුවරුන් 3.3%ක් ද පවති. මෙහි දී සමස්ත නියැදියෙන් අතෘප්තිමත් ගුරුවරුන් දක්නට නොමැත. ඒ අනුව සමස්තයක් වසයෙන් ගුරුවරුන් ගුරුවරයෙකු ලෙස තෘප්තිමත් ව සිටී. ගුරුවරුන් ග්‍රාමීය පාසල්වල ඉගැන්වීම් කටයුතු කිරීමට කැමත්තක් දක්වයි. එම පාසල්වලින් ගුරුවරයාට ලැබෙන සමාජ පිළිගැනීම හා ආදරය බොහෝ වැඩි බව ඔවුන්ගේ අදහස්වලින් පෙනී යයි. විශ්‍රාම යෑමට ආසන්න ගුරුවරුන් බොහෝමයක් තම රැකියා ජීවිතය ගැන සතුටුදායක මට්ටමක රැඳී සිටිති. යෝජනා ලෙස, සිසුන්ට හා ගුරුවරුන්ට තෘප්තිමත් විය හැකි පරිදි අධ්‍යපනික පහසුකම් සලසා දිය යුතුයි. ජාතික ආර්ථිකයට අනාගත තරුණයන් දායකත්වය දිය හැකි ආකාරයට අධ්‍යාපනය වෙනස් විය යුතුයි. රැකියා වෙළඳපොළ සඳහා ඉලක්කගත අධ්‍යාපනයක් අවශ්‍යයි. අනවශ්‍ය ලෙස විවිධ පෝරම් පිරවීම හා ලේඛන කටයුතුවලින් පීඩාවට පත් නො කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ගුරුවරයාට රජයෙන් මීට වඩා අනුග්‍රහය ලබාදිය යුතුයි.

***ප්‍රමුඛ පදඃ*** ගුරු තෘප්තිය , ගුරු තෘප්තියට බලපාන සාධක

[1] අධ්‍යාපනවේදී අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
virajimadushika1@gmail.com